සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මෙතුංග
ශ්‍රියානි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක
සේයා රූ
ප්‍රසන්න තාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege
Horizon - Jagath J Edirisinghe

සම්බන්ධීකරණය

NSW	WA
Lakshman Kodituwakku	Kapila Hemantha
02 9626 7660	Balage
02 9837 5055	08 9456 1972
QLD	**ACT**
Ananda Samaratunga	Asoka Nimalasiri
07 3372 7953	0400 429 031
SA	**TAS**
Chandra Eeriyagama	Anura Seneviratne
08 8331 2318	03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවාත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයන්ගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත්පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සලකන්න.

හෙට....!

දේශීය හා විදේශීය විද්‍යුත් මාධ්‍ය කුමන අනාවැකි හා විචාර ඉදිරිපත් කළ ද ඒ සියල්ල නිෂේධ කරමින් මහින්ද රාජපක්ෂ මහතා දෙවන වරටත් ජනාධිපති ලෙස පත් වී හමාර ය . තමන්ගේ ප්‍රතිවාදීන් පමණක් නොව සිය පාක්ෂිකයනටද ඇදහිය නොහැකි දන්දමේ ඡන්ද ප්‍රතිඵලයක් තුළින් සිය ප්‍රතිවාදියා අභිබවා ගොස් තිබේ . දුෂණ වංචා අවලාද කොපමණ ආවද කිසිදු පරීක්ෂණයකින් හෝ විභාගයකින් හෝ තොරව ඒ සියල්ල යටපත් කරමින් තිබේ. අවසන් ප්‍රතිඵලයට එරෙහි වන්නන්ද දැන් ඉහිරි කොට ඇත්තේ අධිකරණයේ පිහිට පැතීම පමණි. එහෙත් ජනාධිපතිතුමා සිය ජයග්‍රාහී කතාවේ දී තමා සිටින්නේ නීතියටද ඉහළින් බව සියල්ලන්ටම සිහිපත් කර දෙන්නටද අමතක කළේ නැත .

ජනපතිවරයා ජයග්‍රාහී උනුසුම් හරහා රජය විසුරුවා මහ මැතිවරණයට රට සූදානම් කරමින් සිටියි. එහි ප්‍රතිඵලයද මීට සමාන වන බව කල් තියාම තේරුම් ගැනීම අපහසු නැත . මෙවැනි පසුබිමක් තුළ පසුගිය ජනපතිවරණයේදී මතු වූ ප්‍රධාන කරුණු දෙකක් ගැන සඳහන් කරන්නට අපි මෙය අවස්ථාව කොට ගන්නෙමු. සියල්ල මතුපිටින් සාමාන්‍ය ලෙස පෙනුණද ප්‍රජාතන්ත්‍රවාදය මානව හිමිකම් හා මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ ඇති වූ බරපතල ගැටළු රජයේ හා ශ්‍රී ලංකාවේ අනාගතය උදෙසා අතිශය තීරණාත්මක ලෙස බලපාන බව අප පිළිගත යුතු ය. මූලිකවම වර්තමානයේ අපේ රටේ ජනතාවට තමන්ගේ ඡන්දය පාවිච්චි කළ පමණින්ම තම අයිතිය සුරැකුණ යයි සැහීමකට පත්විය නොහැකිය. දන් මතුවී ඇති තත්වය තුළ ඡන්දය දීමීමට ඇති අයිතිය සේම එය රැක ගැනීමට ඇති අයිතිය හා සමානය. එය නිසි ලෙස ගණන් ගැනුනේද යන්න පිළිබඳව සොයා බැලීමට ඇති අයිතිය සුරැකීම ට සහ එය නැති කිරීමට පෙළ ගැසී සිටින කණ්ඩායම් වලට එරෙහි වීමට බලවේගයක් ලෙස ගොඩ නැගීමට කාලය පැමිණ ඇති බව ජනතාව තේරුම් ගත යුතු ය. එය මෙරට සිංහල දෙමල මුස්ලිම් ආදී සියලු ජන කොටස් වලටම පොදු කාරණයකි.

දෙවනුව රජය උතුර හා නැගෙනහිර ජනතාව වෙනුවෙන් යම් යම් සංවර්ධන වැඩ කටයුතු කෙරුණද රටේ පරිපාලන ව්‍යුහය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට දරන ලද ප්‍රථම උත්සාහයේදීම ඔවුන්ව සාප්‍රදූව ඉරක් ගසා වෙන් කරන තත්වයට පත්කිරීම නොකළ යුතුව තිබුණි. මේ ජනපතිවරණය හා ඊට ආසන්න කාල සීමාව තුළ දී දැවිඩ ජනයා අතීතය පසෙකලා ඒකීය ශ්‍රී ලංකාවක් යටතේ ජීවත්වීම සඳහා දකුණ සමග එක් වන්නට දරු සෑම උත්සාහයක්ම දරුනු ලෙස තරාජයට පත් කෙරිණි. ඔවුන් හා සම්බන්ධ වන්නන් කිසිදු වර්ගීකරණයකින් තොරව ද්‍රෝහීන් ලෙස හංවඩු ගසනු ලැබුණි. ජන කොට්ඨාශ දෙකක් අතර ඇතිව තිබූ තිස් අවුරුදු ගාපය අවසන් කොට නව ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමට වෙර දරන ශ්‍රී ලාංකිකයන්ට මෙවැනි වටපිටාවක් යටතේ තමන් ගේ අරමුණු කරා කෙසේ යාමට හැකිදයි යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගී.

මේ කරුණු සම්බන්ධයෙන් යම් යහපත් පියවර ගැනීමට රජය ඉක්මන් විය යුතු ය. එවන් සුබදායී පියවරක් ගැනීමට රජයට සේම රටටටද එකසේ වැඩදායක වනු ඇති බව විශ්වාස ය.

පරාජයේ පීතෘත්වය

ජනාධිපතිවරණය අවසන් වූයේ. මහින්ද රාජපක්ෂ මහතා විසිතිස ජයක් අත්කර දෙමිනි. ඔහුගේ සහ සරත් ෆොන්සේකා මහතාගේ ඡන්ද ප්‍රමාණය අනව වෙනස පමණක් ඡන්ද දහඅට ලක්ෂ හතළිස් දෙදහසකි. මෙය කවර අර්ථයෙන් බැලුවද සුළුමාතර ජයග්‍රහණයකි. එමෙන්ම සුළුමාතර පරාජයකි. කෙසේ වෙතත් මහින්ද රාජපක්ෂ මහතා මේ විශාල වෙනස ගැන පූර්ව බලාපොරොත්තුවකින් සිටි බව පෙනෙයි. 26 වැනිදා උදසන ඡන්දය පාවිච්චි කළ සසු මාධ්‍ය අමතමින් ඔහු කියා සිටියේ, තමා නිකම්ම ජයග්‍රහණයක් නොව 'විජයග්‍රහණයක්' ලබන බවය. ජනාධිපතිවරයාට සහය දුන් සමහර ක්‍රියාකාරිකයන් ද ඡන්දයට පෙර ප්‍රකාශ කර තිබුණේ ලක්ෂ දහයක, පහළොවක පරතරයකින් ජන්දය දිනන බවටය. දන් එය ඉටුවී ඇත. ඒ ජයග්‍රහණය ගැන ගෞරවය ජනාධිපතිවරණයාට ලැබිය යුතුය.

මේ ජනාධිපතිවරණයේ ප්‍රධාන අවධානයන් දෙදෙනා සිටියේ එකිනෙකාට බොහෝ ඇතින් නොවන බව පැහැදිලිව පෙනිණි. ෆොන්සේකා සමග එකග නොවන දේශපාලන විචාරකයන් පවා ප්‍රසිද්ධියේ කියා තිබුණේ සහ සමාජයේ පොදු හැඟීම වූයේ දෙදෙනා අතර පවතිනුයේ ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවකින් තීරණය වන තරට තර තරගයක් බවය. එක් අයකු ජයගන්නේ ඉතා සුළු ඡන්ද ගණනකින් විය හැකි තත්ත්වයක් යටතේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා අවස්ථාවක් නිර්මාණය වනු ඇතැයිද පූර්ව උපකල්පන ගොඩනැඟී තිබිණි. එකිනෙකාගේ මහජන රැස්වීම්වලට සහභාගිවන පිරිස හා ඔවුන්ගේ උනන්දුව මත ඔවුනට ලැබෙන ඡන්ද ප්‍රමාණය ගැන කිසියම් ඉඟියක් ගත හැකි වේ නම් දෙදෙනාගේ රැස්වීම්වලට සහභාගිවූ පිරිසේ සාමාන්‍යය ගැන සලකන විට මෙම ප්‍රතිඵලය කිසිසේත් ඒ හා සමානුපාතික නොවන තරම් වෙනස් බව පැහැදිලිව පෙනෙයි. රටේ අනෙක් ඡන්දදායකයන්ට පමණක් නොව ජනාධිපතිවරයා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළ සමහරුනට පවා එක්තරා ආකාරයක විස්මයක් ඇතිවන තරමට මේ අවසන් ප්‍රතිඵලය අසමානුපාතිකය.

එක් අයකු ජයගන්නේ ඉතා සුළු ඡන්ද ගණනකින් විය හැකි තත්ත්වයක් යටතේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා අවස්ථාවක් නිර්මාණය වනු ඇතැයිද පූර්ව උපකල්පන ගොඩනැඟ තිබිණි. එකිනෙකාගේ මහජන රැස්වීම්වලට සහභාගිවන පිරිස හා ඔවුන්ගේ උනන්දුව මත ඔවුනට ලැබෙන ඡන්ද ප්‍රමාණය ගැන කිසියම් ඉඟියක් ගත හැකි වේ නම් දෙදෙනාගෙ 'ම රැස්වීම්වලට සහභාග ී වූ පිරිසේ සාමාන්‍යය ගැන සලකන විට මෙම ප්‍රතිඵලය කිසිසේත් ඒ හා සමානුපාතික නොවන තරම් වෙනස් බව පැහැදිලිව පෙනෙයි. රටේ අනෙක් ඡන්දදායකයන්ට පමණක් නොව ජනාධිපතිවරයා වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළ සමහරුනට පවා එක්තරා ආකාරයක විස්මයක් ඇතිවන තරමට මේ අවසන් ප්‍රතිඵලය අසමානුපාතිකය.

එහෙත් අපට ප්‍රශ්න ඇත්තේ පරාජයේ කර්තෘභාගය ගැනය. මෙවැනි මොහොතක ජය සක් හඬ මාධ්‍යයේ අමතක වන සත්‍යයක් තිබේ. එනම් පරාජිතයාගේ ඡන්ද ප්‍රමාණයයි. ඡන්ද ලක්ෂ හැටක් ලබමින් මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රාහකයා වන විට ඔහුට එරෙහිව පරාජිතයාට ඡන්දය දුන් හතළිස් එක් ලක්ෂයකට වැඩි පිරිසක් සිටින බව අප බොහෝ දෙනෙකුට මතක නැත. එය ප්‍රතියතයක් ලෙස සියයට හතළිහකට වැඩිය. අතීත ඡන්ද ප්‍රතිශතත් ඒ වගේය වැනි ප්‍රකාශ කැඳවා පරිහාසයට ලක්කරනු නොලැබුවහොත් මේ වනාහී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලනයට එරෙහිව සිටින මිනිසුන් සංඛ්‍යාවයි. මේ පිරිස අතර සිය පක්ෂයේ මෙහෙයවීම නිසා හෝ පෞද්ගලික අකමැත්ත නිසා හෝ මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිවූවන්ට අමතවව සැලකිය යුතු ප්‍රතිශතයක් සිටින්නේ රටේ දේශපාලන ගමන් මග හා ජනාධිපතිවරයාගේ පාලන සිද්ධාන්ත රටේ ප්‍රගමනයට හේතු නොවන බව විශ්වාස කරන, ඒ ගැන කලකිරී මහින්දට එරෙහිව තීරණයක් ගත් පිරිසයි. ඔවුන්ගේ පොදු විරෝධාකල්පයනට හේතු මොනවාදැයි යන්න රහසක් නොවේ.

පසුගිය වසර හතරක කාලය තුළ රාජපක්ෂ ජනාධිපතිවරයා රට පාලනය කළ අන්දම ගැන හේතු සහිත විවේචනයක් ඔවුනට තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගිනාමනාම උල්ලංඝනය කිරීම 17 වැනි සංශෝධනය මුළමනින්ම නොසලකා හැර රාජ්‍ය සේවය දේශපාලය ගැනි එකක් බවට පත් කිරීම අධිකරණයට හා රාජ්‍ය සේවයේ ඉහළ නිලතලවලට දේශපාලනීකරණය වූ නමන්ගේ සමීපතමයන් හෝ ප්‍රසාදයට ලක්වූවන් පත්කිරීම රාජ්‍ය යාන්ත්‍රණය වැදගත් නිලතල බොහොමයක් සඳහා තමාගේ පවුලේ නෑයන්ට දොරටු විවෘත කර දීම ඒ විෂේනයන්ගෙන් කිහිපයක් පමණි. මුළු රාජ්‍ය ව්‍යුහයම වසා සිටින අල්ලස හා දූෂණය නිසිය කඩකරන්නවුන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු නොලැබීම, මාධ්‍ය නිදහස හා අනෙක් මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම, ස්වාධීන කොමිසන් සභා වූවමනාවෙන්ම නොපිහිටුවීම, විධායක ජනාධිපතිධුරයේ බලතල අනිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම වැනි තවත් විශාල ලෙන්දනා ප්‍රමාණයක්ද ඊට අමතරව ආණ්ඩුව කෙරෙහි එල්ල විය. ජනාධිපතිවරයා ඇතුළු සමහර මැති ඇමතිවරුන් ද රටේ දූෂණය බරපතළ ලෙස පවතින බව අනියමින් පිළිගන්නේය. ජනාධිපතිවරයා මැතිවරණ වේදිකාවලදී කියා සිටියේ තමන්ගේ ඊළඟ පුර කාලය වෙන්කරන්නේ දූෂණය නැති කිරීමට බවය. ජනවාරි 24 වැනිදා ඉරිදා ලංකාදීපයට කතා කරමින් ඔහු

3 වන පිටුවට

කෝ.ඩබ්ලිව්.ජනරංජන

ලබමින් මහින්ද රාජපක්ෂ මහතා ජයග්‍රාහකයා වන විට ඔහුට එරෙහිව පරාජිතයාට ඡන්දය දුන් හතළිස් එක් ලක්ෂයකට වැඩි පිරිසක් සිටින බව අප බොහෝ දෙනෙකුට මතක නැත. එය ප්‍රතිශතයක් ලෙස සියයට හතළිහකට වැඩිය. අතීත ඡන්ද ප්‍රතිශතත් ඒ වගේය වැනි ප්‍රකාශ කැඳවා පරිහාසයට ලක්කරනු නොලැබුවහොත් මේ වනාහී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලනයට එරෙහිව සිටින මිනිසුන් සංඛ්‍යාවයි. මේ පිරිස අතර සිය පක්ෂයේ මෙහෙයවීම නිසා හෝ පෞද්ගලික අකමැත්ත නිසා හෝ මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිවූවන්ට අමතවව සැලකිය යුතු ප්‍රතිශතයක් සිටින්නේ රටේ දේශපාලන ගමන් මග හා ජනාධිපතිවරයාගේ පාලන සිද්ධාන්ත රටේ ප්‍රගමනයට හේතු නොවන බව විශ්වාස කරන, ඒ ගැන කලකිරී මහින්දට එරෙහිව තීරණයක් ගත් පිරිසයි. ඔවුන්ගේ පොදු විරෝධාකල්පයනට හේතු මොනවාදැයි යන්න රහසක් නොවේ.

පසුගිය වසර හතරක කාලය තුළ රාජපක්ෂ ජනාධිපතිවරයා රට පාලනය කළ අන්දම ගැන හේතු සහිත විවේචනයක් ඔවුනට තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගිනාමනාම උල්ලංඝනය කිරීම 17 වැනි සංශෝධනය මුළමනින්ම නොසලකා හැර රාජ්‍ය සේවය දේශපාලය ගැනි එකක් බවට පත් කිරීම අධිකරණයට හා රාජ්‍ය සේවයේ ඉහළ නිලතලවලට දේශපාලනීකරණය වූ නමන්ගේ සමීපතමයන් හෝ ප්‍රසාදයට ලක්වූවන් පත්කිරීම රාජ්‍ය යාන්ත්‍රණය වැදගත් නිලතල බොහොමයක් සඳහා තමාගේ පවුලේ නෑයන්ට දොරටු විවෘත කර දීම ඒ විෂේනයන්ගෙන් කිහිපයක් පමණි. මුළු රාජ්‍ය ව්‍යුහයම වසා සිටින අල්ලස හා දූෂණය නිසිය කඩකරන්නවුන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු නොලැබීම, මාධ්‍ය නිදහස හා අනෙක් මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම, ස්වාධීන කොමිසන් සභා වූවමනාවෙන්ම නොපිහිටුවීම, විධායක ජනාධිපතිධුරයේ බලතල අනිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම වැනි තවත් විශාල ලෙන්දනා ප්‍රමාණයක්ද ඊට අමතරව ආණ්ඩුව කෙරෙහි එල්ල විය. ජනාධිපතිවරයා ඇතුළු සමහර මැති ඇමතිවරුන් ද රටේ දූෂණය බරපතළ ලෙස පවතින බව අනියමින් පිළිගන්නේය. ජනාධිපතිවරයා මැතිවරණ වේදිකාවලදී කියා සිටියේ තමන්ගේ ඊළඟ පුර කාලය වෙන්කරන්නේ දූෂණය නැති කිරීමට බවය. ජනවාරි 24 වැනිදා ඉරිදා ලංකාදීපයට කතා කරමින් ඔහු

3 වන පිටුවට